ජගත් ජේ එදිරිසිංහ

# කටු

18

හසන්ත පිටව ආවේ කෝපයත් කළකිරීමත් මුසුවූ මහත් අසහනකාරී මානසිකත්වයකින් යුතුව ය. සිය ව්‍යාපාර පිළිබඳ මුලු කාලයත් මුලු අවධානයත් යොදමින් සිටි ඔහුට බලය උදෙසා මේ තරම් පහත් තැනකට වැටෙන්නට කෙනෙකුට හැකියාවක් ලැබෙන්නේ කෙසේදැයි සිතාගත නොහැකි තරම් විය. තමා විසින් බල අධිකාරිය සමග පවත්වාගෙන යනු ලබන පයුරු පාසානම මෙවන් තැනකට තමා ගෙන යතැයි ඔහු සිහිනයකිනුදු නොසිතුවේය. මහ ජනකායක් ඉදිරියේ නිරුවතින් සිටගෙන සිටන්නට සිදුවූ මිනිසකුට දැනෙන විළියම ඔහුට දැනුණි.

ශූර ව්‍යාපාරිකයා සිය ව්‍යාපාර වර්ධනය උදෙසා අවංක නොවන ක්‍රියා ඕනෑ තරම් කර ඇත. එය ඔහුට අමුත්තක් නොවේ. එනමුදු ඒ කිසිදු අවස්ථාවක ඒ වෙනුවෙන් වෙනෙකෙකුට පෞද්ගලිකව අයහපතක් වන තැනට ඔහු කිසිවිටෙක කටයුතු නොකළේය. මේ තරගය තුළත් සිය ආත්මාභිමානය රැකගන්නට ඔහුට අවශ්‍ය විය. එනමුදු දැන් මේ සිදුවෙමින් පවතින්නේ කිසිදු ආකාරයකින් අනුමත කළ නොහැකි ක්‍රියාදාමයකි. තමාගෙන් මේ සා උදව් උපකාර ලබාගත් මේ මිනිසුන් ඉතා සැළසුම් සහගතව තමා විදුල සම්බන්ධ සිදුවීම් පෙළට පටලැවීමට හේතුව දැන් හසන්ත දනියි. බලය ඉදිරියේදී කිසිවකු වැදගත් නැත. ඔහු දැන් ඒ පාඩම මැනැවින් දනියි. වඩාත් නිවැරදි පැහැදිළි කිරීම නම් ඔහුට ඒ පාඩම දැන් නිවැරදිව කියා දී ඇති බවයි.

මේ ක්‍රියාදාමය මෙතැනින් නවතිනු ඇතැයි ඔහුට නොසිතෙයි.



"මට දැන් ගොඩක් දේවල් තේරෙනවා නිරාශා.. " හසන්ත කීවේ නොසිඳුණ නොයිවසිල්ලකින් තවමත් තමා දෙස බලා සිටිනා නිරාශා දෙස එක එල්ලේ බලමින්ය. ".. මං මිනිස්සුයි කියල හිතාගෙන ඉඳල තියෙන අය බලාගෙන යන-කොට මිනිස්සු නෙවෙයි.."

නිරාශා යමක් කියන්නට තැත්කර නැවත නිෂ-ශබ්ද වූවාය. ව්‍යාකූලව ඇති සිත අදහස් නිසි ලෙස ගොණු නොකරයි. ඇගේ නිහඬතාව ඔහුගේ සිතේ ඇති කරන්නේ ව්‍යාකූල සිතුවිලි සමූහයකි. මේ සියල්ල ඇයට තේරුම් ගත හැකි වනු ඇතිද?

".. මේක අපි දෙන්න අතරෙ ප්‍රශ්නයක් කරගන්න එපා.. ඔයත් මාත් දෙන්නම ඉන්නෙ එකම පැත්තක.. ඒක තේරුම්ගන්න." ඔහු කියනු ඇයට ඇසුණි.

නිරාශා සුසුමක් හෙලා ඔහු දෙස බැලුවේය.

"මගේ හිත අවුල් වෙලා හසන්ත.. කිසිම දෙයක් අලුතින් හිතන්න බැරි තරමට හිත අවුල්.. එක අතකින් මේ වෙලාවෙ හරි වැරදි හොය හොයා ඉන්න එකත් වදයක්" ඈ කීවාය. ".. දැන් මට ඕනෙ එකම එක දෙයක් විතරයි.. ඉක්මනට විදුල සනීප කරගන්න එක.."

පසුදා සමදරා හමුවූ මොහොතේත් ඇය කීවේ එයමය. සමදරා ගෙනවුත් තිබූ චෙක්පත දෙස නොබලාම නැවත එය ඇයටම දුන් නිරාශා ගේ මුවේ නැගී තිබුණේ උපහාසාත්මක සිනාවකි.

"දකුණතින් මිනී මරන ගමන් වමතින් මල් පූජා කරන මිනිස්සු" නිරාශාගේ වදන් වල රැඳී තිබුණේද ඒ උපහාසයමය.

නිරාශා හා වාද කිරීමේ තේරුමක් නැත. ඇගේ තීරණයේ දැඩි බව ඇගේ දෑසේ බැල්ම කියයි. සමදරා කිසිවක් නොකියා චෙක් පත නැවත තම අත්බෑගයට දමා ගත්තාය.

"ඇමතිතුමාට කියන්න ස්තූතියි කියල .. විදුල නැතුව කෝටියක් ලැබුණත් මට වැඩක් නැහැ සාමා.."

"ඇමතිතුමා මේවට සම්බන්ධ නැහැ නිරාශා.."

"සමහරවිට වෙන්න ඇති.. ඒත් එයා ඉන්නෙ හෙ-ාරුන්ගෙ ගේ ඇතුළෙ.. එකට කා ගෙන බී ගෙන.. එකට පාටි දාගෙන.. වචනයකින්වත් හෙ-ාරුන්ට විරුද්ධ නොවී.. සියල්ල අනුමත කරමින්.. වරද ඉස්සරහ නිශ්ෂබ්දව ඉන්න මිනිහගෙත් වරද කරන මිනිහගෙත් වෙනසක් මට පේන්නෙ නැහැ සාමා.. වරද දැක දැක නිශ්ෂබ්දව ඉන්නවා කියන්නෙත් අනියමින් වරද අනුමත කිරීමක්ම තමයි."

පිළිතුරක් ලෙස කිසිවක් කියන්නට සමදරා උත්සාහ නොකළාය. කිසිවකු ආරක්ෂා කිරීමේ තේරුමක් නැති බව ඇය දනියි. අනුන්ගේ පව් වලට කරගසන්නට තරම් අඥාණ විය යුතු නැත.

විදුලට කළ පහරදීම පිළිබඳ සාධාරණ පරීක්ෂණයක් ඉල්ලා අගනුවරදී පැවැත්වුණ උද්ඝෝෂණය මැර ප්‍රහාරයකින් කඩාකප්පල් වූ ප්‍රවෘත්තිය ඇය අසා සිටියේ මේ එන අතර සිය වාහනයේ ගුවන් විදුලි යන්ත්‍රයෙනි. පහරදීමෙන් ජ්‍යෙෂ්ඨ සිනමාවේදී ගුණරත්නටද තුවාල සිදුවී ඇති බවත් කියැවිණි. පොලු ගත් මැරවරයන් පහර දීම කර තිබුණේ පොලිසිය බලා සිටියදීම යයි කීමට තරම් ශක්තියක් රජයේ නොවන එම මාධ්‍ය ආයතනටය තිබුණි. අද සවසට මාධ්‍ය ප්‍රකාශකයා මේ ගැන කියනු ඇත්තේ කුමක්දැයි සමදරා දනියි.

"කෝප ගත් මහජනතාව කළ පහරදීමකි."

කෝප ගත් මහජනතාව සාමකාමී උද්ඝෝෂණ වලට පහරදීම පිළිබඳ කතාව මුලින්ම ගෙතුවේ අසූව දශකයේදී ජේ ආර් ය. ඒ අපකීර්තිමත් ඉතිහාසය පුනර්ජීවනය ලබන සැටි පුදුමය. වඩාත් පුදුමය අද මේ කතාව ගොතන්නේ එදා පහර කෑවුන් වීමය.

ආණ්ඩුව සියල්ල අවුල් කරගනිමින් සිටියි. කිසිවකුට හානියක් නොවන සාමකාමී උද්ඝෝෂණයක් පවා ඉවසා සිටින්නට බැරි තරමේ උද්ධච්ච මානසිකත්වයකින් හැසිරවෙන බල අධිකාරිය හමුවේ සියල්ල විනාශය කරා ගමන් කරමින් තිබෙන බව පැහැදිළිය. මේ සිදුවීම් පෙන්වා දෙන්නේ වරද පෙන්වා දෙන්නට තරම් ශක්තියක් ඇති එකම මිනිසකු හෝ බල අධිකාරියේ සීමා මායිම් අතර නොසිටින බවයි. එසේත් නොවේ නම් බලාධිකාරිය කිසිවකුට ඇහුම් කන් නොදෙන බවයි. මේ දෙකෙන් කොයික සිදුවුවද ලැබෙන්නේ එකම ප්‍රතිඵලයමය.

"අඩුමගානෙ බුද්ධිමතුන්වත් කට අරින්න ඕනෙ.. " සාරානන්ද ඇමතිවරයා කීවේ එලෙසය. තමන්ට කරන්නට ශක්තියක් නැති යමක් වෙනත් කිසිවකු විසින් කරනු ලබනු ඇතැයි ඔහු බලා සිටියි.

"සර්ල හදන්නෙ බළල්ලු ලවා කොස් ඇට බා-වන්න නේද..?" අසන්නට තිබුණේ ඒ පැනය වුවත් එය සිතෙහිම රඳවා ගෙන සිටින්නට සමදරා තීරණය කළාය.

බොහෝ බුද්ධිමතුන් කළාක් මෙන් රට හැර යාමට කාලය සුදුසු යයි සමදරාට සිතුණි. අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් කම අතහැර ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වී දුම්රියපළක් බලා කියාගෙන සිටින තම මිතුරිය ඇයට සිහිපත්වෙයි.

"දේශපාලක පරයන්ට ඔලුව පාත් කරගෙන ඉන්නවට වඩා මේක දාහෙන් සම්පතයි සාමා.." මිතුරිය ඇයට කීවේ අන්තිම වතාවට දුරකතන ඇමතුමක් දුන් දවසේය. ".. ජීවිතේ වැදගත්ම දෙයක් තමයි ආත්මාභිමානය තියාගෙන